**ඔපෙක් අරමුදලින් මුල්‍යයනය කරන ඒ 017 මාර්ග පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (රක්වාන-සුරියකන්ද) - 2021**

---

ඔපෙක් අරමුදලින් මුල්‍යයනය කරන ඒ 017 මාර්ග පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ (රක්වාන-සුරියකන්ද) 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මෙම ව්‍යාපෘතිය 2019 ජනවාරි 01 දින පවත්වන ලද අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ගන්නා ලද තීරණයකට අනුව ක්‍රියාත්මක වේ. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකනු ලබන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ තොරතුරු අනුව ප්‍රවාහන සහ මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. රක්වාන ප්‍රදේශයේ කිලෝමීටර 130.6 ආරම්භ කර සබරගමු පළාතේ සුරියකන්ද කිලෝමීටර 112.6න් අවසන් වන ශ්‍රී ලංකාවේ ඒ 017 මාර්ගයේ කිලෝමීටර 18ක් පුනරුත්ථාපනය කිරීම අරමුණ වේ. ව්‍යාපෘතියේ සමස්ථ අරමුණ වනුයේ සම්බන්ධතාව සහ ප්‍රවිශවීමේ හැකියාව වැඩිදියුණු කිරීම මගින් ශ්‍රී ලංකාවේ ආර්ථික ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම සහ පොදු සමාජ- ආර්ථික සංවර්ධනයට දායකවීම වේ. මාර්ගය දෙපස තද සහ මෘදු උරහිස් සහිත මංතීරු දෙකක අධිවේගී මාර්ගයක් (10.0m) ලෙස සැලසුම් කරනු ලැබේ. ණය ගිවිසුම අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 6,947.2කට සමාන එ.ජ.ඩො මිලියන 50.54 වන අතර ඉන් රු.මිලියන 5,497.9කට සමාන එ.ජ.ඩො මිලියන 40ක් අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල මගින් මුල්‍යායනයට එකගවී තිබුණි. ණය ගිවිසුම 2019 ඔක්තෝබර් 30 දින අත්සන් කරන ලද අතර 2023 සැප්තැම්බර් 30 දින අවසන් වීමට නියමිත වේ. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ සිවිල් ඉදිකිරීම් කටයුතු 2022 ජුනි 30 දින වන විටත් ආරම්භ කර නොතිබුණි.

## 1.3 මතය

---

ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පිළියෙල කිරීම, සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම පිළිබඳව වගකීම ඊට සම්බන්ධ පාර්ශවය විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීම සම්බන්ධව විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හෝ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත්කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී ඒ සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හෝ වැරදි තනිව හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑම් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය හා වෘත්තීය සැකයෙන් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් හා ක්‍රියාත්මක කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ යෝග්‍ය විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනානොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදි.

## 2. ව්‍යාපෘතියේ භෞතික හා මූල්‍ය කාර්යසාධනය

### 2.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ ප්‍රගතිය

| | විගණන ගැටලු | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | තොරතුරු අනුව, ව්‍යාපෘතිය කොන්ත්‍රාත් පැකේජ 3ක් යටතේ කිලෝමීටර 112+600 සිට කිලෝමීටර 130+600 දක්වා කිලෝමීටර 18ක පුනරුත්ථාපන කටයුතු ආරම්භ කිරීමට සැලසුම්කර තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන කටයුතුවල ප්‍රමාදයන් හේතුවෙන් 2022 ජුනි 30 දිනවන විටත් කොන්ත්‍රාත් පැකේජ 3හි කොන්ත්‍රාත් | එකගවේ. ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ඒ සඳහා ප්‍රදානකරුගේ එකගතාවය ලැබීමෙන් පසු ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කරනු ලැබේ. කෙසේවෙතත්, ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ පාලනයෙන් බැහැර ප්‍රසම්පාදන කටයුතු සඳහා ප්‍රදානකරුගේ | සිවිල් ඉදිකිරීම් කටයුතු තවදුරටත් ප්‍රමාදවීමකින් තොරව ආරම්භ කිරීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රදානය කිරීමේ කටයුතු නිමකර නොතිබුණි. | එකගතාවය ලැබීමේ විශාල ප්‍රමාදයක් ඇත. | |
| (ආ) | ජාතික අයවැයෙහි තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් කර ඇති රු.මිලියන 33ක ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපාදනයෙන් ව්‍යාපෘතිය විසින් සියයට 18ක් නියෝජනය කරන රු.මිලියන 5.97ක් පමණක් උපයෝජනය කර තිබුණි. | එකගවේ.<br>ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ව්‍යාපෘතිය 2022 වර්ෂයේ පළමු කාර්තුව තුළ ආරම්භ කිරීමට සැලසුම්කර තිබුණද ප්‍රදානකරුගේ එකගතාවය ලැබීමේ ප්‍රමාදය හේතුවෙන් ආරම්භ කිරීමේ දිනය ප්‍රමාදවී ඇති අතර වෙන්කරන ලද මුදලෙහි වියදම අඩුවීමට හේතුවී තිබුණි. | වෙන් කරන ලද සම්පත් කාර්යක්ෂමව උපයෝජනයට ව්‍යාපෘතියේ කටයුතු නිසි පරිදි සැලසුම් කළ යුතුය. |

## 2.2 ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කිරීමේ ප්‍රමාදයන්

| විගණන ගැටලුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| ශ්‍රී ලංකා රජය 2019 වර්ෂයේ ඒ 017 මාර්ගයේ කිලෝමීටර 18ක් පුනරුත්ථාපන ව්‍යාපෘතියේ (සූරියකන්ද - රක්වාන) පිරිවැය ලෙස ජාත්‍යන්තර සංවර්ධන සඳහා වූ ඔපෙක් අරමුදලින් එ.ජ.ඩො මිලියන 40ක ණයක් ලබාගෙන තිබුණද ණය ගිවිසුමේ දින සිට වර්ෂ 3ක් ගතවීමෙන් පසුවද ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ආරම්භකර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස 2021 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ණය පහසුකම අපේක්ෂිත අරමුණ සඳහා උපයොජනයකින් තොරව නිශ්කාර්යව පැවතුණි. තවද, ණය පහසුකම 2023 සැප්තැම්බර් 30 දින කල්පිරීමට නියමිත වේ. | එකගවේ.<br>ව්‍යාපෘතිය සඳහා ප්‍රසම්පාදන කටයුතු 2020 ජනවාරි මස තුළ ආරම්භ කර තිබුණු අතර රජය 2020.05.18 දින ණය මුදල කොවිඩ් -19 හදිසි සහය කටයුතුවල භාවිතයට තීරණය කර තිබුණි. කෙසේවෙතත්, ඉහත ඉල්ලීම සඳහා ප්‍රදානකරු ප්‍රතිචාර දක්වා නොතිබුණු අතර පසුව විදේශ සම්පත් දෙපාර්තමේන්තුව ඉල්ලීම නොසලකා හරින ලෙස ප්‍රදානකරු වෙත දන්වා ඇති අතර 2021.02.22 දින යෝජිත මාර්ග දියුණු කිරීමේ කටයුතු ක්‍රියාත්මක කිරීමට තීරණය කර තිබුණි. ඒ අනුව ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කරන ලදි. කෙසේවෙතත්, මෙම තත්ත්වය හේතුවෙන් ඉඩම් අත්පත් කර ගැනීම සහ අනෙකුත් ආයතනවලින් අනුමැතිය ලබා ගැනීම වැනි වෙනත් කටයුතු මන්දගාමීව සිදුවිය. | 2023 සැප්තැම්බර් 30 දින ණය පහසුකම කල්පිරීමට පෙර මුළු ණය පහසුකම උපයෝජනයට පියවර ගත යුතුය. |

## 2.3 ඉඩම් අත්පත්කර ගැනීම සම්බන්ධ ගැටලු

| විගණන ගැටලුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ලැබී ඇති තොරතුරු අනුව, ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් පැකේජ 1හි ඉදිකිරීම් සඳහා ඉඩම් කට්ටි 736ක් අත්පත් කර ගැනීමට සැලසුම්කර තිබුණි. ව්‍යාපෘතිය ඉඩම් කට්ටි 227ක් සඳහා පමණක් 38(අ) වගන්තිය නිකුත් කර තිබුණු අතර 17 වගන්තිය යටතේ කිසිදු ඉඩම් කට්ටියක් සඳහා වන්දි මුදල් තක්සේරු කර නොතිබුණි. තවද, 2022 ජූනි 30 දිනට අනෙකුත් කොන්ත්‍රාත් පැකේජ දෙකෙහි ඉදිකිරීම් සඳහා ව්‍යාපෘතිය විසින් ඉඩම් අත්පත් කර ගැනීමේ ආරම්භක කටයුතු පමණක් සිදුකර තිබුණු බව නිරීක්ෂණය විය. එමනිසා මාර්ගයෙහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට වැඩබිමෙහි අයිතිය අදාළ කොන්ත්‍රාත්කරු වෙත භාරදීමට නොහැකි වේ. | කොලොන්න (කිලෝමීටර 112.6 – 118.1) සහ ගොඩකවෙල (කිලෝමීටර 118.1 – 130.6) යනාදි ප්‍රාදේශීය ලේකම් කාර්යාල 2ක යටතේ ඉඩම් අත්පත්කර ගැනීම් සිදුකරමින් පවතී. ප්‍රාදේශීය ලේකම් කාර්යාල, මිනින්දෝරු දෙපාර්තමේන්තුව සහ තක්සේරු දෙපාර්තමේන්තුව යනාදි රජයේ ආයතන තුනක සහභාගීත්වයෙන් ඉඩම් අත්පත්කර ගැනීම් සිදුකරනු ලැබේ. රටෙහි පවතින වර්තමාන තත්ත්වය හේතුවෙන් ඉඩම් අත්පත්කර ගැනීමේ ක්‍රියාවලියේ ප්‍රමාදයක් පවතී. කෙසේවෙතත්, ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ පවතින මාර්ග කොටස් සඳහා 38(අ) වගන්තිය ගැසට් නිවේදනය 2021.07.25 දින ප්‍රසිද්ධ කර ඇත. | එකගවූ කාලසීමාවක් තුළ කොන්ත්‍රාත්කරු වෙත වැඩ බිමෙහි අයිතිය බාරදීමට හැකිවන පරිදි ඉඩම් අත්පත්කර ගැනීම් කටයුතු කඩිනම් කිරීමට පියවර ගැනීම අවශ්‍ය වේ. |